# ඉල්ලුම්පත්‍ර කැඳවීම

සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් තනතුරු සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. සමිති බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ඔබ විසින් සකස් කරන ලද ඉල්ලුම්පත්‍රයක් නිසි ලෙස සම්පූර්ණකර පදිංචිය පිළිබඳ සහතිකය, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග 2024.06.18 දිනට පෙර ගරු සභාපති තුමා, සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, අංක 04, පෙරේරා මාවත, බණ්ඩාරවෙල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුරු නාමය හා වැටුප් පරිමාණ අංකය සඳහන් කළ යුතුය.

**තනතුර : සාමාන්‍යාධිකාරී (තනතුරු 01 )**

**වැටුප් පරිමාණ අංකය : 1:1**

**වැටුප් පරිමාණය : 22,000-625x7-650 x 8-675 x 9-700 x 16 = 48,850.00**

**වයස් සීමාව : අවුරුදු 23 සිට අවුරුදු 45 දක්වා**

**(සමිතිය මගින් අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.)**

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

(අ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන සාමාන්‍ය උපාධියක් ලබාතිබීම හා පිළිගත් වාණිජ, කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ආ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ /ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයක සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ සිව් අවුරුදු වාණිජවේදී ඩිප්ලෝමාව සමත්වීම හා පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ඇ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයක උසස් ජාතික ව්‍යාපාර අධ්‍යන ඩිප්ලෝමාව හෝ උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව හෝ කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව සමත්වීම හා පිළිගත් වාණිජ, කාර්මික ආයතනයක කළමණාකරණ මට්ටමේ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ඈ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික සමුපකාර මණ්ඩලයේ උසස් පෙළ සමත්වීමේ සහතිකය සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 03 කට නොඅඩු පළපුරුද්ද

**තනතුර : ලේකම් (තනතුරු 01)**

**වැටුප් පරිමාණ අංකය : 2:1**

**වැටුප් පරිමාණය : 17,000-475X7-500 X 8-525 X 9-550 X 16 = 37,850.00**

**වයස් සීමාව : අවුරුදු 21 සිට අවුරුදු 45 දක්වා**

**(සමිතිය මගින් අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.)**

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

(අ.) අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී එකවර විෂයන් 03 ක් සමත්වීම සහ පිළිගත් වාණිජ/කාර්මික ආයතනයක සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳ වසර 03 කට නොඅඩු පළපුරුද්ද

**හෝ**

(ආ) සමුපකාර විද්‍යාලය මගින් පිරිනමන ඩිප්ලෝමා සහතිකය හා පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ඇ) සමුපකාර සේවක උසස්පෙළ විභගය සහ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක සාමාන්‍ය කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු පළපුරුද්ද

**තනතුර : ඖෂධවේදී (තනතුරු 01 )**

**වැටුප් පරිමාණ අංකය : 2:1**

**වැටුප් පරිමාණය : 17,000-475X7-500 X 8-525 X 9-550 X 16 = 37,850.00**

**වයස් සීමාව : අවුරුදු 19 සිට අවුරුදු 45 දක්වා**

**(සමිතිය මගින් අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.)**

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

(අ.) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයන් 03 ක් සමත්වීම හා අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් ලබාතිබීම.

(ආ) පිළිගත් ආයතනයක පවත්වන ලද ඖෂධවේදී විභාගයෙන් සමත් වීම සහ පිළිගත් ආයතනයන ඖෂධවේදී තනතුරක වසර 01 කට නොඅඩු සේවා පළපුරුද්ද.

**තනතුර : නි. සාමාන්‍යාධිකාරී - වාණිජ පාරිභෝගික (තනතුරු 01 )**

**වැටුප් පරිමාණ අංකය : 1:2**

**වැටුප් පරිමාණය : 19,000-525X7-550 X 8-575 X 9-600 X 16 = 41,850.00**

**වයස් සීමාව : 23 සිට අවුරුදු 45 දක්වා**

**(සමිතිය මගින් අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.)**

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

(අ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන වාණිජවේදී සාමාන්‍ය/ විශේෂ උපාධියක් ලබා තිබීම හා පිළිගත් වාණිජ, කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ආ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ /ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයක සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ සිව් අවුරුදු වාණිජවේදී ඩිප්ලෝමාව සමත්වීම හා පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ඇ) ජාතික සමුපකාර මණ්ඩලයේ උසස් පෙළ සමත් වීමේ සහතිකය සමග පිළිගත් වාණිජ /කාර්මික ආයතනයක මධ්‍යම කළමනාකරණ මට්ටමේ අදාළ ක්ෂේත්‍ර යේ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

(ඈ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික සමුපකාර මණ්ඩලයේ උසස් පෙළ සමත් වීමේ සහතිකය සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක කළමනාකරණ මට්ටමේ විසර 03 කට නොඅඩු පළපුරුද්ද.

**තනතුර : ක්ෂේත්‍ර නිලධාරී - ග්‍රාමීය බැංකු (තනතුරු 03 )**

**වැටුප් පරිමාණ අංකය : 3:1**

**වැටුප් පරිමාණය : 16,000-400X7-425 X 8-450 X 9-500 X 16 = 34,250.00**

**වයස් සීමාව : අවුරුදු 21 සිට අවුරුදු 45 දක්වා**

**(සමිතිය මගින් අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.)**

**(පිරිමි අයදුම්කරුවන් විශේෂයි)**

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

(අ.) අ.පො.ස (උසස් පෙළ) විෂයන් 03 කින් එකවර සමත්වීම හෝ සමුපකාර සේවක උසස් පෙළ සහතිකය සහ පිළිගත් වාණිජ/කාර්මික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 03 කට නොඅඩු පළපුරුද්ද

**හෝ**

(අ.) අ.පො.ස (සාමාන්‍ය පෙළ) ගණිතය සහ භාෂාව හා සාහිත්‍ය ඇතුලුව විෂයන් 04 කට සම්මාන සාමාර්ථය සහිතව විෂයන් 06කින් එකවර සමත්වීම හා පිළිගත් වාණිජ කාර්මික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්ද

**තනතුර : ලේඛන භාරකරු (තනතුරු 01)**

**වැටුප් පරිමාණ අංකය : 4:1**

**වැටුප් පරිමාණය : 12,000-300X7-325 X 8-350 X 9-375 X 16 =25,850.00**

**වයස් සීමාව : අවුරුදු 19 සිට අවුරුදු 45 දක්වා**

**(සමිතිය මගින් අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ. )**

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

(අ) ඉංග්‍රීසි, ගණිතය, සිංහල ඇතුළු විෂයන් 06 කින් අ. පො.ස. සාමාන්‍ය පෙළ සමත්ව තිබීම හා පිළිගත් ආයතනයක අදාළ තනතුරේ වසර එකකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්ද

**සාමානයාධිකාරී,**
**2024-05-30,**
**සි/ස බණ්ඩාරවෙල වි සේ.ස. සමිතිය,**
**අංක 04, පෙරේරා මාවත, බණ්ඩාරවෙල.**